සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව			අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 07 දරන ශ්‍රී ලංකා සමාගම් පනත				
	(i)	131 (1) වගන්තිය	සෑම සමාගමක්ම අවම වශයෙන් වසරකට වරක්වත් වාර්ෂික වාර්තාව (Annual Return) සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලබාදිය යුතු වුවද 2019 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා (Annual Return) සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලබාදී නොතිබුණි.	අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙනස් වන බැවින් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු මිය ගිය විට ඊට අදාළ කටයුතු සංකීර්ණ වීම යන හේතූන් නිසා මෙම ප්‍රමාදය සිදුවුණු බව, 2015 වසරේ සිට 2019 වසර දක්වා හිඟ Annual Return සමාගම් රෙජිස්ටාර් වරයා වෙත මේ වන විට යොමු කර අවසන් අතර 2025 වර්ෂය දක්වා වන ඉතිරි Annual Return මෙම වර්ෂය අවසන් වීමට පෙර නියමිත ආකෘති ප්‍රකාරව ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව.	සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii)	223 (2) (අ) සහ (ආ) වගන්ති	සමාගමේ ලේකම් හෝ අධ්‍යක්ෂවරුන් පිළිබඳව වෙනසක් සිදු වූ විට ඒ වෙනස, සමාගමේ ලේකම් හෝ අධ්‍යක්ෂ පිළිබඳව ලේඛනයෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදු	-එම-	-එම-

		වූ විට ඒ වෙනස, ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතිය අනුව රෙජිස්ට්‍රාර් වෙත යැවීමට වග බලා ගත යුතු වුවද 2019 වර්ෂයෙන් පසුව සිදුවූ වෙනස්කම් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.		
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත			
(i)	38 (1) උප වගන්තියේ (ඇ) ඡේදය	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මූල්‍ය පාලනය සඳහා FR 135 අනුව මූල්‍ය වර්ෂයක් ආරම්භ වීමට පෙර අදාළ වර්ෂයේ Delegation of Financial control/ Power සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීම සමාගම විසින් සිදු කරනු ලබන බව, සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් අභ්‍යන්තර විගණන අංශයේද අධීක්ෂණයට යටත්ව සමාගම තුල ක්‍රියාත්මක වන අතර තවදුරටත් ජාතික විගණන පනත ප්‍රකාරව ඒ සම්බන්ධ වැඩිදුර උපදෙස් ජාතික විගණන කාර්යාලයෙන් ලබා ගැනීමටද අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	38 (2) උප වගන්තිය	පනතේ 38(1) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 හා xii වන පරිච්ඡේදයේ 7.2 හා 7.3 වගන්ති, 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 සහ 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.	මාණ්ඩලික නිළධාරියෙකුට සති අන්තයෙහි හා රජයේ නිවාඩු දිනවල වැඩකිරීම වෙනුවෙන් එසේ වැඩ කළ එකිනෙක දිනය සඳහා ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/20 ක සමාන මුදලක් ලබා ගැනීමට හැකි වන අතර ඒ සඳහා දිනකට පැය 08 කට නොඅඩු කාලයක් සේවය කළයුතු මෙන්ම අතිකාල හා නිවාඩුදින වැටුප් ආදිය නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේනම් එම කාලය ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතු නමුත් ඇඟිලි සළකුණු මුද්‍රිත පිටපත් පරීක්ෂා කිරීමේදී පැය 08 කාලයක් සේවය නොකරන නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,464,180 ක නිවාඩුදින වැටුප් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, එක් කාර්යයක් වෙනුවෙන් අදාළ කරගත යුත්තේ එක් දීමනාවක්/ වරප්‍රසාදයක් පමණක් වුවද මෙම දීමනාවට අමතරව ඉරිදා දිනයක වැඩ කරන නිලධාරින් සඳහා ඒ වෙනුවෙන් රු.473,614ක නිවාඩු දින දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි. එසේම ලිත් මාසයකට දින 02 වැඩි දින ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබාගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ සමාගමක් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වන රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හෝ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අදාළ නොවන බැවින් "රාජ්‍ය ව්‍යාපාර සඳහා පරිපාලන කාර්යය සංග්‍රහයක් සකස් කිරීම" යන මැයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවන ලද 2017/03/15 දිනැති ලිපියට සමාගම විසින් 2016 වර්ෂයේ පිළියෙල කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද "පරිපාලන රීති සංග්‍රහය" 2017/04/25 දිනැති ලිපියෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව, 2010 වර්ෂයේදී ත්‍රිපෝෂ වැඩසටහන සී ටී සී සර්විසස් සමාගමේ කළමනාකාරීත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නා අවස්තාවේදි 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 12(1) වගන්තිය යටතේ සාමූහික ගිවිසුමකට/ බේරුම් පත්‍රයකට එකගතාවය ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරීත්වය විසින්ද අතිකාල හා නිවාඩු දින දීමනා සඳහා පෙර පැවති ක්‍රමවේදය පරිදි කටයුතු කිරීමට	ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

එකඟතාවය පලකර ඇති බව, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත අනුව හා ඉහත සඳහන් කරන ලද බේරුම් කිරීමේ කොන්දේසි පත්‍රය ප්‍රකාරව අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් කිරීම සිදු කරනු ලබන බව, මෙහිදි ජ්‍යොෂ්ඨ මට්ටමේ කළමනාකාරීත්ව නිලධාරීන්ද වැටුප් ලබනුයේ සමාගමේ අරමුදල් වලින් වන බැවින් ඔවුන්ද සාප්පු හා කාර්යාල සේවක පනත අනුව කාර්යාල සේවකයින් යටතේ වර්ගීකරණය කරන බව, කාර්යාල සේවකයින් සඳහා සතියේ දිනයන්හිදීත් පැය 08 ඉක්මවූ රාජකාරී සඳහා පැය 1 : 1.5 රේටයෙන් අතිකාල හිමි වන නමුත් ජ්‍යොෂ්ඨ මට්ටමේ නිලධාරීන්ට එසේ හිමි නොවන බව, සේවා අවශ්‍යතාවය අනුව ජ්‍යොෂ්ඨ මට්ටමේ නිලධාරීන් නිවාඩු දිනයන්හිදි වරින් වර වුවද සේවා ස්ථානයට වාර්තා කිරීම / පිටත රාජකාරී කටයුතු සඳහා සහභාගී වීම සිදු වන බැවින් නිවාඩු දින හා හිලව් නිවාඩු දින දීමනා ඒ අනුව සිදු කරනු ලබන බව, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිත සමාගමේ සියලුම අංශ ආවරණය වන මෙහෙයුම් අත්පොතෙහි සහ පරිපාලන රීති සංග්‍රහයෙහි ඉහත වගන්ති ඇතුළත්ව

			ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව විසින් ඉල්ලා ඇති තොරතුරුද එම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව, පැය 24 පුරා නිෂ්පාදන කටයුතු සිදු වන ආහාර නිෂ්පාදන සමාගමක් වන බැවින් මාසයකට දින 02කට සීමා කොට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ සේවා ලබා ගැනීම ප්‍රායෝගික නොවන බව, එබැවින් විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කරන බව.	
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880	රජයේ මුදල්, බඩු බාහිරාදිය භාර ගැනීම හෝ බාරව සිටීම, එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ඇප තැබිය යුතු නිලධාරින් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ඇප තැබිය යුතු නිලධාරී කාණ්ඩයන් සම්බන්ධ විස්තර විගණන හා කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	රාජ්‍ය ව්‍යාපාර හැසිරීම පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව			

	විසින් නිකුත් කරන ලද අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත			
(i)	මාර්ගෝපදේශයේ 2 වන පරිච්ඡේදයේ 2.3 ඡේදය	අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික අයවැය ලේඛනයද ඇතුළත් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර එම සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. අනුමත නොකරන ලද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළද එම සැලැස්ම මාර්ගෝපදේශ උපදෙස් ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ මූලික අරමුණ වනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන ප්‍රතිලාභි ඇස්තමේන්තු සඳහා ත්‍රිපෝෂ නිෂ්පාදනය කර අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමට අවශ්‍ය තොග නිකුත් කිරීම බව, එබැවින් අදාළ ප්‍රතිපාදන ලබා දෙනු ලබන රේඛීය අමාත්‍යාංශය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්මේ ආකෘති ප්‍රකාරව සමාගමේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමත් සෑම කාර්තුවකට වරක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් ඒකකයටත් මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතත් ඊමේල් කිරීම සිදු කරනු ලබන බව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන් කරනුයේ ත්‍රිපෝෂ මිළදී ගැනිමට වන බැවින් හා ප්‍රග්ධන ප්‍රතිපාදන වෙන් කිරිමක් සිදු නොකළ බැවින් අදාළ ආකෘති ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන ලද බව.	රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	මාර්ගෝපදේශයේ 5 වන පරිච්ඡේදයේ 3 ඡේදය	අයවැයගත ආදායම් ප්‍රකාශයක්, අයවැයගත මූල්‍ය තත්ත්වය දක්වන වාර්තාවක්, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් හා ප්‍රාග්ධන වියදම් අයවැයක් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී ඇතුළත් කළ යුතු වුවද මාර්ගෝපදේශය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි අයවැයගත ආදායම් ප්‍රකාශයක්, අයවැයගත මූල්‍ය තත්ත්වය දක්වන වාර්තාවක්, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරි වර්ෂයන් හි අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිමේදි ඉදිරිපත් කළ හැකි බව, සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යංශයේ ඉල්ලිම පරිදි 2024 වර්ෂය සඳහා අමාත්‍යංශයේ ආකෘති ප්‍රකාරව ප්‍රග්ධන වියදම් අයවැයක් පිළියෙල කොට ඉදිරිපත් කලද 2021 වර්ෂයේ සිට ජාතික අයවැය දෙපාර්තමේන්තුව හරහා කිසිදු ප්‍රග්ධන ප්‍රතිපාදනයක් සමාගමට ලැබි නොමැති බව.	-එම-
(iii)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.2(v) ඡේදය	දිරිදීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය රහිතව සුපෝෂ නිෂ්පාදනයෙන් ඉලක්කගත දීමනාවක් ලෙස සමාගමේ සියළුම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.22,104,660 ක් ගෙවා තිබුණි. මෙම දීමනාව පෙර වර්ෂයේ අලෙවි ආදායම මත පදනම්ව ලාභයෙන් ප්‍රතිශතයක් ලෙස රු.12,687,147 ගෙවීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එය අලෙවි ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගෙවීම කිරීම නිසා පෙර වර්ෂයට වඩා සියයට 74 කින් වැඩි අගයක් ගෙවා තිබුණි. එසේම සමාලෝචිත	සමාගමේ සියළු අංශ ආවරණය වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත මෙහෙයුම් අත්පොත 2024/01/11 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව, 2017-2020 වර්ෂය දක්වා වාර්ෂිකව ගෙවනු ලැබූ මෙම සුපෝෂ දිමනාව 2020 වර්ෂයේ සිට මාසික ඉලක්ක දිමනාවක් ලෙස ලබා දෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග පැවති සාකච්ඡාවකදි උපදෙස් ලබා දි ඇති බව, තවද සමස්ථ නිෂ්පාදනය මත පදනම්ව නිෂ්පාදන ඉලක්ක දිමනා ලබා දිය	රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

			වර්ෂයේදී ත්‍රිපෝෂ නිෂ්පාදනය ඉලක්ක කරගනිමින් නව ඉලක්කගත දීමනාවක් හඳුන්වාදී ඒ සඳහා රු.19,732,082 ක් අනුමැතියක් රහිතව ගෙවා තිබුණි. ත්‍රිපෝෂ නිෂ්පාදනය මත ඉලක්ක දීමනාවක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත නිෂ්පාදනයෙන් සියයට 60 ක අගයක් පමණක් සපුරාගෙන තිබියදී මෙම දීමනාව ගෙවා තිබුණි.	යුතු බව 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තාවෙන් නිර්දේශ ලබා දී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ත්‍රිපෝෂ නිෂ්පාදන ඉලක්ක දිමනාවද මෙහෙයුම අත්පොතට ඇතුළත් කොට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුව මගින් අදාළ දිමනා සම්බන්ධ ඇගයීම කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇති අතර සමාගම විසින් ඊට අදාළ තොරතුරුද ඉදිරිපත් කර ඇති බව.	
	(iv)	මෙහෙයුම් අත්පොතේ 3 වන පරිච්ඡේදයේ 3.3 ඡේදය	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය සහ සංවිධාන සටහන් ඇතුළත් උපාය මාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතින අතර ඒ අනුව ඊට අදාළ අනුමැතින් ලබා ගැනිමට කටයුතු කරන බව.	-එම-
	(v)	මෙහෙයුම් අත්පොතේ 3 වන පරිච්ඡේදයේ 3.6 ඡේදය	සමාගම විසින් උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර, එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිළධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, තෘතික මට්ටම සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් සිදුකර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි හා අදාළ මාර්ගෝපදේශය ප්‍රකාරව සේවකයා සහ කළමනාකාරිත්වය අතර ප්‍රධාන කාර්යය සාධන දර්ශක හදුනා ගෙන ඒ අනුව කාර්යය සාධන ඇගයීම් සිදු කරන බව.	-එම-
(ඊ)	2022 ජනවාරි 14 දිනැති අංක		ඉන්ධන දීමනාව ලබාදිය හැක්කේ HM වැටුප්	PED 1/2015 චක්‍රලේඛය ප්‍රකාරව කිලෝමීටර 100	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව

	01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	කාණ්ඩයේ නිලධාරින් සඳහා පමණක් වුවද, සමාගම විසින් MM වැටුප් කාණ්ඩයේ නිලධාරින් 05 දෙනෙකු සඳහා එක් අයෙකුට රු.20,000 බැගින් ඉන්ධන දීමනා ලෙස රු.1,200,000 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි.	දක්වා (Up & Down) කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා මධ්‍යම මට්ටමේ (MM) කළමනාකරුවන්ට හිමිකම පවතින බව, ඒ අනුව පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කොට සමාගම වෙත වැය වන පිරිවැය සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත අදාළ ඉන්ධන දිමනාව ලබා දෙන ලදි බව, තවද සමාගමේ මෙහෙයුම් අත්පොතේද අදාළ වගන්ති ඇතුළත් කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතද යොමු කොට ඇති බව.	කටයුතු කළ යුතුය.
(උ)	2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ හා 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ හි 02 (v) ඡේදය	වැටුප් හා දීමනා තීරණය කළ යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුරට ලබා දී තිබුණු වැටුප් කේත යටතේ පමණක් වන අතර අමතර ගෙවීම් ලෙස සිදු කරනු ලබන සියලු දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද ඊට අනුකූළ නොවන පරිදි සමාගම විසින් සුපෝෂ නිෂ්පාදන කටයුතු සඳහා බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරු හට අමතර දීමනාවක් ලෙස මාසිකව රු.10,000 බැගින් සමාලෝචිත වර්ෂයේදි රු.120,000 ක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත ගෙවා තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමාගමේ මෙහෙයුම් අත්පොතෙහි අදාළ දිමනා සම්බන්ධ විස්තර ඇතුළත් කර ඇති අතර වර්තමානයේදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුව විසින් එය ඇගයීම් කටයුතු සිදු කරන බව, අදාළ කළමණාකරු සුපෝෂ සන්නාමය අලෙවිය හා ප්‍රවර්ධනය සඳහා බඳවා ගෙන තිබුණද ත්‍රිපෝෂ බෙදාහැරිමේ සෘජු අධික්ෂණයද සිදු කරන බව	-එම-

(ඟ)	2013 මාර්තු 28 දිනැති අංක DMS/E4/13/08/413/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය	සමාගම වෙනුවෙන් 2010 දෙසැම්බර් 02 දින අනුමත කළ සියලු තනතුරු සඳහා අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන පරිදි සකස් කරන ලද, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිර්දේශිත බඳවා ගැනීම් පටිපාටිය ක් අනුමත කර තිබුණද එදිනෙන් පසුව එක් එක් අවස්ථාවන්වලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද කළමනාකරු (අළෙවි ප්‍රවර්ධන), ගිණුම් නිලධාරී, ඉංජිනේරු සේවා නිලධාරී , වෛද්‍ය නිලධාරී සහ හෙද නිලධාරී යන තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර අනුමත කරවාගෙන නොතිබුණු අතර අනුමත බඳවාගැනීම් පටිපාටියකින් තොරව බඳවා ගැනීම් සිදු කර තිබුණි.	විගණනය විසින් පෙන්වා දි ඇති තනතුරු සඳහා බඳවා ගැනිමේ පටිපාටි (SOR) අනුමත කරවා ගැනිමට අවශ්‍ය ලිපි ආකෘති ප්‍රකාරව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	-එම-
(එ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 ජනවාරි 10 දිනැති හා අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 11.6 ඡේදය	නිසි අනුමැතියකින් තොරව රජයේ අරමුදල් භාවිතා කරමින් රක්ෂණ ක්‍රම, සහන ණය යෝජනා ක්‍රම සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වැනි වැඩසටහනක් ක්‍රියාත්මක නොකළ යුතු බව දක්වා තිබුණද, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සේවකයින් සඳහා සුපෝෂ නිෂ්පාදන අලෙවි ලාභය භාවිතා කර රු. මිලියන 5 ක උපරිමයකට යටත්ව වෛද්‍ය රක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා 2019 ජුලි 01 දිනැති අංක 2019/02 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබා දී තිබුණි. ඊට පටහැනිව 2024/25 වර්ෂයට අදාළව	සමාගමේ ස්ථිර කාර්යය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුලේ සමාජිකයන්ට 2019 වර්ෂයේ සිට සෞඛ්‍ය රක්ෂණ යොජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද බව, ආරම්භයේදි රු.මිලියන 05ක සිමාවකට මෙය ක්‍රියාත්මක කිරිමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවු බව, වෛද්‍ය බිල්පත් ගාස්තු හා නේවාසික ප්‍රතිකාර ගාස්තු ඉහළ යාම හේතුවෙන් සහ සමාගමේ සේවකයන්ගේ හිමිකම් පැම් ඉහළ යාම හේතුවෙන් 2023/08/01 දින සිට බාහිර රෝගි	-එම-

	රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත රු. 9,643,892ක් ගෙවීම් කර තිබුණි.	ප්‍රතිලාභය වාර්ෂිකව රු.20,000ක සිමාවකටද නේවාසික රෝගී ප්‍රතිලාභය රු. 200,000 ක සිමාව දක්වා වැඩි කිරිම සිදු කරන ලද බව, සමාගමේ සියළුම සේවා කාණ්ඩයන්ට සමසේ ප්‍රතිලාභ ලබා දෙන මෙම වෛද්‍ය රක්ෂණ යොජනා ක්‍රමයට රජයේ අරමුදල් භාවිතා කිරිමක් සිදු නොවන බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.371,268,008 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 555,406,517 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.184,138,509 ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහිමට ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන තුළ රු.430,000,000 ක් ලෙස සඳහන් අක්කර 6 රූඩ් 3 පර්චස් 19.7 ක්වූ සමාගම ස්ථාපනය කර ඇති ඉඩමෙහි අයිතිය සමාගමේ නමට නොපවතින බවත් නිරවුල් අයිතියක් නොමැති මෙම ඉඩමෙහි රු.178,114,948 ක ගොඩනැගිලි ඉදිකර ගිණුම්ගත කර ඇති බවත් සමාලෝචිත වර්ෂය තුළ ඉඩම සඳහා රු.18,000 ක ඵලදායිතා බදු ගෙවා ඇති නමුත් ඉඩමෙහි අයිතිය සමාගමේ නමට පවරාගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.	CTC සර්විසස් සමාගම මගින් කළමනාකරනය සිදු කිරිමෙන් පසුව 2010 වර්ෂයේදි සෞඛ්‍ය අමාත්‍යංශයට අනුබද්ධිත පූර්ණ රජය සතු සමාගමක් ලෙස සංස්ථාපනය සිදු කොට මුදල් අමාත්‍යංශය මගින් පවරා ගන්නා අවස්ථාවේදි ද අදාළ ඉඩමේ වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කර ඇති බව, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කොටස් ප්‍රග්ධනය (රු. මිලියන 304.6) තුළ ද මෙම ඉඩමේ වටිනාකම ද අන්තර්ගතව ඇති බව, තවද ඉඩමේ සැලැස්ම අනුව මෙය රජය සතු ඉඩමක් ලෙස සටහන්ව ඇති බවත් නැවත මිනුම් කිරිමක් සමාගම මගින් සිදු කර ඇති අතර ඒ අනුව රජයේ ඉඩමක් විම මත අදාළ	මෙම ඉඩම කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

		ඵලදායිතා බදු ගෙවා ඇති බව, ඉඩමේ ඔප්පුව සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කිරිමෙන් පසුව ලබා ගන්නා බව.	
(ආ)	යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු.192,091,525 ක් ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් 2021 වර්ෂය තුළදී ලබාදී තිබුණු අතර, එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එහි කල්පිරුණු අගය රු.255,537,214 ක් වූ අතර විගණිත දින තෙක් මෙම අරමුදල් සැපයූ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	සයිලෝ ව්‍යාපෘතිය සඳහා වන මූලික ඇස්තමේන්තුව රු. මිලියන 800 ක් බව, එම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට ප්‍රතිපාදන වෙන් කරන බව, රජයේ අයවැය කථාවේදි ප්‍රකාශ කළත් ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුධ තත්ත්වය හමුවේ අදාළ ප්‍රතිපාදන සමාගමට නොලැබුණු බව, මේ හේතුවෙන් ලෝක ආහාර සංවිධානය (WFP) මගින් බඩඉරිගු මිලදි ගැනිමේ බිල්පත් ප්‍රතිපූර්ණය උදෙසා වාර කිහිපයකදි ලබා දුන් ප්‍රදාන වන රු.192,091,525 ක මුදල ඉදිරි සයිලෝ ව්‍යාපෘතිය උදෙසා භාවිතා කරන ලෙසට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දෙන ලද බව, ලෝක ආහාර සංවිධානයේ (WFP) 2026-2028 ප්‍රග්ධන සැලැස්ම තුළින් ඉතිරි ප්‍රතිපාදන ලබා ගැනිමට ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සමග සාකච්ඡා කරමින් පවතින බව.	අරමුදල් ලබාදුන් අරමුණ වෙනුවෙන් යෙදවිය යුතුය

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ත්‍රිපෝෂ සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා යොදාගත හැකි Anderson I හා Anderson II ලෙස යන්ත්‍ර 02 ක් පවතින අතර එහි ධාරිතාවයන් පිළිවෙලින් 1800 Kg/hr (Blends 2) හා 3600 Kg/hr (Blends 4) විය. ඒ අනුව සමාගමේ මුළු යන්ත්‍ර ධාරිතාවය පැයකට කිලෝ ග්‍රෑම් 5400 ක් විය.		
	(i) Anderson II යන්ත්‍රයෙන් 2024 වර්ෂයේ සැලසුම්ගත දින 278 තුල දී මෙට්‍රික් ටොන් 24,019ක් නිෂ්පාදනය කළහැකි වුව ද සමාගම විසින් Anderson II	ඇන්ඩර්සන් ii යන්ත්‍රයේ Machine Capacity 3,600 Kg / hr වුවද 2024 වර්ෂයේ ත්‍රිපෝෂ අවශ්‍යතාවය අනුව පැයට 2,250 Kg ධාරිතාවය යටතේ නිෂ්පාදනය සැලසුම් කරන ලද බව,	මෙම යන්ත්‍ර ප්‍රශස්ථ ධාරිතාවයෙන් භාවිතා කිරීම සඳහා විධිවිධාන සැළසුම් කර ක්‍රියාත්මක කළ

	යන්ත්‍රය මත පැයකට කිලෝ ග්‍රෑම් 2,250 ක ධාරිතාවයක් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුල මෙට්‍රික් ටොන් 14,560 (අපතය ද ඇතුළත්ව) ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබුණි. එසේ වුව ද සමාලෝචිත වර්ෂයේ තත්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8,636 ක් විය. ඒ අනුව මෙම යන්ත්‍රය ඌන උපයෝජන මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	නමුත් බඩඉරිගු අවශ්‍ය ප්‍රමාණයට සහ වේලාවට නොලැබීම හේතුවෙන් සැලසුම් කළ නිෂ්පාදනය සිදු කිරිමට නොහැකි වූ බව, බඩඉරිගුවල පැවති ඇෆ්ලටොක්සින් මට්ටම හේතුවෙන් වයස අවුරුදු 03ට අඩු දරුවන් සඳහා ත්‍රිපෝෂ ලබා දීමද සිදු නොකරන ලද බව.	යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලසුම සකස් කිරීමේදී Anderson I යන්ත්‍රය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර මෙම යන්ත්‍රය ඉහත දින ගණනට සමගාමීව ක්‍රියාත්මක කළහොත් සමාලෝචිත වර්ෂය තුල මෙට්‍රික්ටොන් 6,005 ක් නිෂ්පාදනය කළහැකි වුව ද 2024 වර්ෂයේ ජූලි මස 16 දින සිට 31 දින දක්වා Anderson I යන්ත්‍රය ක්‍රියාත්මක කර මෙට්‍රික්ටොන් 382 ක් පමණක් නිෂ්පාදනය සිදුකර තිබුණි. ඉහත කරුණු අනුව මාස 11.5 ක පමණ කාලයක් මෙම යන්ත්‍රය නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.	කාර්යය මණ්ඩලය අප සතුව සිටින්නේ ඇන්ඩර්සන් ii යන්ත්‍රය සඳහා පමණක් බව, නමුත් ඇන්ඩර්සන් ii යන්ත්‍රයෙහි නඩත්තු කටයුක්තකදි ඇන්ඩර්සන් ii යන්ත්‍රයේ කාර්යය මණ්ඩලය යොදා ගනිමින් අවශ්‍යතාවය අනුව ඇන්ඩර්සන් i යන්ත්‍රය භාවිතයෙන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන බව.	-එම-
(ආ)	සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලස්ම අනුව නිෂ්පාදනයෙන් සියයට 3 ක අපතයක් සිදුවිය හැකි බව සලකා වර්ෂය තුල මෙට්‍රික් ටොන් 14,123 ක් නිෂ්පාදනයට සැලසුම්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය මුළු නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 8,636 ක් වූ බැවින් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 61 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. තවද මාසික නිෂ්පාදන සැලැස්ම හා සැසඳීමේදී තථ්‍ය නිෂ්පාදනය සියයට 22.5 සිට සියයට 98.2ක පරාසයකින් යුක්ත විය.	2024 වර්ෂයේ ඇසුරුම් අංශයේ ස්ථාපිත කර තිබුණු පැරණි ෆයිබර් ගබඩා ටැංකි 03 ගලවා ඉවත් කොට නව සුදු යකඩ ටැංකි 03ක් ස්ථාපිත කිරිම හා නියමිත ප්‍රමාණයට ගුණාත්මක බඩඉරිගු ලබා ගැනිමට නොහැකි විමෙන් නිෂ්පාදනය ක්‍රමානුකූලව පවත්වා ගැනිමට නොහැකි විම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වූ බව.	වාර්ෂික නිෂ්පාදන ඉලක්ක සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ සමාගම විසින් යන්ත්‍ර දින 278 ක් නිෂ්පාදන කටයුතු කිරීමට සැලසුම් කර තිබුණද යන්ත්‍ර දින 188 ක් පමණක් නිෂ්පාදන කටයුතු සිදුකර තිබුණි. ඒ අනුව දින 90 ක් නිෂ්කාර්යව පැවති අතර නිෂ්පාදන ක්‍රියාවලියේදී අමුද්‍රව්‍ය ලෙස බඩඉරිඟු අවශ්‍යතාවය සම්පාදනය කරගැනීමට නොහැකිවීම, කිරිපිටි සම්පාදනය කරගැනීමට නොහැකි වීම සහ යන්ත්‍ර අක්‍රිය වීම යනාදී හේතු මත යන්ත්‍ර දින 80 ක් නිෂ්පාදන වලින් බැහැර වූ බවට විගණනයට තොරතුරු ඉදිරිපත් වූව ද ඉතිරි යන්ත්‍ර දින 10 ක කාලයක් යන්ත්‍ර පැය අහිමි වීමට හේතුව විගණනයට ඉදිරිපත් නොවීය. සමාලෝචිත වර්ෂයේ සැලසුම්ගත නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 14,123 හා තථ්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8,636 ක්වූ අතර මෙට්‍රික් ටොන් 5,487 ක නිෂ්පාදනයක් ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේ වූව ද විවිධ හේතුන් මත ලඟාකර ගැනීමට නොහැකි වූ නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4,334.1 ක් ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර මෙට්‍රික් ටොන් 1,152.9 ක නිෂ්පාදනය ලගාකර ගැනීමට නොහැකි වූ හේතුන් විගණනයට ඉදිරිපත් නොවීය.	ගුණාත්ම අමුද්‍රව්‍ය නොලැබිම නිසා නිතර නිතර යන්ත්‍ර නතර කිරිමට සිදු වීම හේතුවෙන් යන්ත්‍රයේ නිෂ්පාදන කාළය අඩු විම සිදු වන බව, ගුණාත්මක අමුද්‍රව්‍ය ක්‍රමාණුකුලව ලබා ගැනිමට හැකියාව පැවතියේ නම් යන්ත්‍රයේ නිෂ්පාදන ධාරිතාව අනුව නොකඩවා නිෂ්පාදනය කිරිම මගින් 2024 තුළ සමාලෝචනය කළ නිෂ්පාදනය සියයට සියයක් කිරිමට හැකි වනු ඇති බව.	මෙම යන්ත්‍ර ප්‍රශස්ථ ධාරිතාවයෙන් භාවිතා කිරීම සඳහා විධිවිධාන සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලස්ම අනුව අපේක්ෂිත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 14,123 ක් වූ අතර එයින් මෙට්‍රික් ටොන් 11,328 ක් (80.2%) ත්‍රිපෝෂ නිෂ්පාදනය හා මෙට්‍රික් ටොන් 2,795 (19.79%) ක් සුපෝෂ නිෂ්පාදනයට සැලසුම් කර තිබුණද 2024 වර්ෂයේ මුළු නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 8,636 න් ත්‍රිපෝෂ මෙට්‍රික් ටොන් 6,294 (73%) ක් හා සුපෝෂ මෙට්‍රික් ටොන් 2,342 (27%) නිෂ්පාදනය කර තිබුණි.	2024 නිෂ්පාදන සැලැස්ම තුළ සියයට 20 ක් ලෙස සුපෝෂ නිෂ්පාදනය පුරෝකථනය කර ඇති අතර සත්‍ය නිෂ්පාදනය මුළු නිෂ්පාදනයෙන් සියයට 27 ක් දක්වා වැඩි වුවද අදාළ වර්ෂයේ සුපෝෂ ඉල්ලුමෙන් සියයට 40ක ප්‍රමාණයක් පමණක් සමාගම විසින් අලෙවි නියෝජිතයන් මාර්ගයෙන් වෙළඳපොළට නිකුත් කර ඇති බව.	වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.
(ඉ)	එසේම සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලස්ම අනුව මාසික මුළු නිෂ්පාදනයෙන් සියයට 8 සිට සියයට 36 දක්වා වූ අගය පරාසයක් තුළ සුපෝෂ නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ තථ්‍ය සුපෝෂ නිෂ්පාදනය සියයට 17 සිට	ගුණාත්මක අමුද්‍රව්‍ය (බඩඉරිගු) ක්‍රමණුකුලව ලබා ගැනිමට නොහැකි විම නිසා සුපෝෂ සහ කැලරි බාර් ඉල්ලුමට සරිලන පරිදි සැපයුමක් වෙළඳපොලට නිකුත් කිරිමට නොහැකි වු බව, මෙහිදි ත්‍රිපෝෂ ප්‍රතිලාභි දත්ත මත	-එම-

	සියයට 45 දක්වා වූ ඉහළ ප්‍රතිශතයන්ගෙන් නිෂ්පාදනය කිරීමට සමාගම කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.තවද සමාගම පිළියෙල කරන ලද නිෂ්පාදන සැලස්ම අනුව සුපෝෂ නිෂ්පාදනය හා කැලරි බිස්කට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය සඳහන් කර නොතිබුණු බැවින් එම නිෂ්පාදන අවශ්‍යතා වෙනුවෙන් වූ අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය හඳුනාගත නොහැකි විය. ඒ අනුව ත්‍රිපෝෂ අවශ්‍යතාවයට ඇස්තමේන්තු කරන ලද අමුද්‍රව්‍ය සුපෝෂ හා කැලරි බිස්කට් වෙනුවෙන් යොදවා ගැනීම තුළින් සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවෙන් අපේක්ෂිත වූ අරමුණ ඉටු නොවන බව නිරීක්ෂණය විය.	පදනම්ව ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණයන් නිර්ණය කිරීමත් සුපෝෂ ඉල්ලුම සහ පසුගිය වර්ෂවල විකුණුම් දත්ත මත පදනම්ව සුපෝෂ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණයන් නිර්ණය කිරීමක් සිදු කරනු ලබන බව, අඛණ්ඩ අමුද්‍රව්‍ය සැපයුම් දාමයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු වර්තමානයේදි සිදු කරමින් පවතින අතර ඒ අනුව සුපෝෂ කැලරි බාර් සඳහා ද නිෂ්පාදන සැලැස්මක් අලෙවි අංශ පුරෝකථන මත සකස් කරන බව.	
(ඊ)	ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කර නිරෝගී ජාතියක් ගොඩනැගීමේ අරමුණින් පෝෂණය අවශ්‍ය සියලු ගැබිණි සහ කිරිදෙන මව්වරුන් ඇතුළු අපේක්ෂිත ප්‍රතිලාභීන්ට ත්‍රිපෝෂ නිෂ්පාදනය කර නොමිලේ බෙදාහැරීම ත්‍රිපෝෂ සමාගමේ ප්‍රධාන කාර්යභාරය ලෙස දක්වා ඇති අතර ඒ අනුව ඉලක්කගත හා ප්‍රතිලාභීන්ට අතිරේක ආහාර වේලක් ලෙස ත්‍රිපෝෂ සැපයීම පිළිබඳ පරීක්ෂාවේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (RDHS) ඇතුළු රෝහල් හා ආයතන 38 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ මාස්ටර් බෑග් අවශ්‍යතාවය 493,905 ක්ව පැවති අතර වර්ෂයේදී බෙදාහරින ලද මාස්ටර් බෑග් ප්‍රමාණය 274,198 ක් වූ අතර එය අවශ්‍යතාවයෙන් සියයට 55.51 ක අඩු අගයක් බව නිරීක්ෂණය විය. අනුරාධපුර, මහනුවර, නුවරඑළිය, බේරුවල සහ කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා ආයතනවල අවශ්‍යතාවයෙන් මුලු බෙදාහරින ලද ප්‍රතිශතය සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක් විය.	2024 වර්ෂයේ ප්‍රතිලාභී අවශ්‍යතාවය අනුව අයවැයගත නිෂ්පාදන සැලැස්ම සකස් කලද ගුණාත්මක අමුද්‍රව්‍ය ක්‍රමානුකූලව නොලැබීම මත සත්‍ය නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා බාධක පැවති බව, තවද අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් දුම්රිය වැගන් මගින් ත්‍රිපෝෂ ලබා ගැනීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලෙසට යොමු කර ඇති බව.	සෞඛ්‍ය අමාත්‍යාංශය හා ත්‍රිපෝෂ සමාගම එක්ව ත්‍රිපෝෂ බෙදාහැරීමේ විධිමත් යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

(උ)	සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ශ්‍රී ලංකාවේ මාතෘ හා ළදරු මන්දපෝෂණය අවම කරනු පිණිස ශ්‍රී ලංකාව විසින් බලගන්වනු ලබන අතිරේක ආහාර නිෂ්පාදනයන් සඳහා පහසුකම් සැලසීම හා වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය තක්සේරු කර ඒවා සැපයීමට අවශ්‍ය කටයුතු කිරීම සිදුකළ යුතු වුව ද මාසික ත්‍රිපෝෂ බෙදාහරින ලද ප්‍රමාණය අවශ්‍යතාවයෙන් සියයට 11.98 සිට සියයට 103.53 පරාසයකින් යුක්ත වූ අතර 2024 ජූලි මස සියයට 11.98 ක් ලෙස අවම ප්‍රතිශතයකින් ත්‍රිපෝෂ බෙදාහැර තිබුණු අතර වර්ෂයේ මාස 12 න් මාස 6 කදී අවශ්‍යතාවයෙන් සියයට 50කට වඩා අඩු ප්‍රතිශතයකින් ත්‍රිපෝෂ බෙදාහැර තිබුණි. මාර්තු මාසයේදී සියයට103.53 ලෙස අවශ්‍යතාවය ඉක්මවා ත්‍රිපෝෂ බෙදාහැර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙහිදී පෙර මාසවලට අදාළ ඌන තොග සමඟ මාසික අවශ්‍යතාව බෙදාහැර තිබුණු අතර නිසි සැලැස්මකින් ත්‍රිපෝෂ නිෂ්පාදනය කර බෙදාහැරීම සිදුනොකිරීම මීට හේතු වී පැවති බව නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ මාස 12 ක් තුල ත්‍රිපෝෂ අවශ්‍යතාවයන්ට අනුව ත්‍රිපෝෂ බෙදාහැරීම් සිදු කිරීමේදී, ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා වන පළමු මාස හය තුල ත්‍රිපෝෂ අවශ්‍යතාවයෙන් සියයට 69 කට ආසන්නව හා සියයට 50 ඉක්මවා ත්‍රිපෝෂ බෙදාහැරීම් සිදු කර ඇති බව, සියයට 50 කට වඩා අවම ප්‍රතිශතයකින් ත්‍රිපෝෂ බෙදාහැරීම් සිදු කර ඇත්තේ අවසාන මාස හය තුලදී බව, ත්‍රිපෝෂ බෙදාහැරීමේදී මාසික අවශ්‍යතාවය ඉක්මවා බෙදාහැරීම් සිදු කර නොමැති අතර 2024 වර්ෂයේ මාර්තු මස බෙදාහැරීමේ ප්‍රතිශතය සියයට 104 කට ආසන්න අගයකින් පෙන්නුම් කරනුයේ අදාළ මාර්තු මසදී ආයතන කිහිපයක් සඳහා පෙර මාසයන්ට අදාළ හිඟ ත්‍රිපෝෂ තොග නිකුත් කිරීමක් සිදු කර තිබීම හේතුවෙන් බව.	-එම-
(ඌ)	පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ වෙබ් පිටුවට අනුව 2024 දෙසැම්බර් මාසය වනවිට ශ්‍රී ලංකාව තුල අඩුබර සහිත වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ ප්‍රතිශතය සියයට 22 ක් වූ අතර ශරීර ස්කන්ධ දර්ශක (BMI(අගය 18.5 ට වඩා අඩු මව්වරුන්ගේ ප්‍රතිශතය සියයට 13.6 ක්ව තිබුණු අතර අඩු බර දරු උපත් සංඛ්‍යාව සියයයට 14.6 ක් විය. මේ අනුව එම අගයන්ගේ ඉහළම ප්‍රතිශතය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වුව ද වර්ෂය තුල එම දිස්ත්‍රික්කය තුළ ත්‍රිපෝෂ බෙදාහැරීම වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 43 ක අඩු අගයක පැවතුණි.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ත්‍රිපෝෂ බෙදාහැරීම් සඳහා වන අවශ්‍යතාවය ලබා ගනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශයෙන් සහ පවුල් සෞඛ්‍ය කාර්යංශය තුළින් බව, එබැවින් විගණනය විසින් පෙන්වා දි ඇති තොරතුරු අදාළ ආයතන වෙත යොමු කොට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගත යුතු බව.	-එම-
(එ)	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (RDHS (ඇතුළු රෝහල් හා ආයතන ආයතන 38 ක් වෙත මාසික අවශ්‍යතාවය අනුව මාසිකව ත්‍රිපෝෂ බෙදාහැරීම සිදුකළ යුතු වුවත්, ත්‍රිපෝෂ ආයතනය විසින් නිකුත් කරන ලද	2024 වර්ෂයේ ප්‍රතිලාභී අවශ්‍යතාවය අනුව අයවැයගත නිෂ්පාදන සැලැස්ම සකස් කලද ගුණාත්මක අමුද්‍රව්‍ය ක්‍රමානුකූලව නොලැබීම මත සත්‍ය නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා බාධක පැවති බව, ඇතැම් ආයතන	-එම-

	ඉන්වොයිසි දින පරීක්ෂාවේදී දින 01 සිට දින 144 ක් දක්වා වූ පරාසයකින් ආයතන වෙත ඉන්වොයිස් පත්‍ර නිකුත් කර ඇති බවත්, දින 60 (මාස 02) ඉක්ම වූ කාලයකට පසු ත්‍රිපෝෂ නිකුත් කළ අවස්ථා 41 ක් පැවති බවත්, දින 90 (මාස 03) ඉක්ම වූ අවස්තා 09 ක් පැවතුණු අතර ඒ අනුව ත්‍රිපෝෂ බෙදාහැරීමේ කාර්යය ඉතා අකාර්යක්ෂම ලෙස පැවති බව නිරීක්ෂණය විය.	ත්‍රිපෝෂ ලබා ගැනීමට නොපැමිණෙන අතර ඒවන් අවස්ථාවන්හිදී අදාළ ආයතනවල මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරා ගැනීමට දීර්ඝ කාලයක් ගත වනු ඇති බව, ගුණාත්මක අමුද්‍රව්‍ය ක්‍රමානුකූලව ප්‍රසම්පාදනය කිරීම මගින් සමාගමේ නිෂ්පාදන සැලැස්ම සියයට 100 ක් ලගා කර ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත තොග බෙදාහැරීමද සියයට 100ක් දක්වා ලගා කර ගැනීමට අවශ්‍ය කෙටිකාලීන හා දිගු කාලීන සැලසුම් සෞඛ්‍ය අමාත්‍යංශය, කෘෂිකර්ම අමාත්‍යංශය සහ කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව සමග සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	
(ඒ)	මව්වරුන් හා දරුවන් සඳහා වූ මාසික මාස්ටර් බෑග් අවශ්‍යතාවය 100 ඉක්මවන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ඇතුළුව ආයතන 29 ක් පැවති අතර එම ආයතනවලින් මව්වරු සහ දරුවන් සඳහා වෙන වෙනම අවස්ථා 696 කදී මාසිකව ඉල්ලුම් කරන බෑග් සංඛ්‍යාවෙන් සපයන ලද මාස්ටර් බෑග් සංඛ්‍යාව අවස්ථා 329 කදී සියයට 50 ට වඩා අඩු අගයක පැවතුණි. මෙලෙස ඉතා අඩු ප්‍රතිශතයන්ගෙන් මාසික ත්‍රිපෝෂ බෙදාහැරීම තුළ ආයතනයේ සැළසුම්කරණය ඉතා දුර්වලතාවයක පවතින බව නිරීක්ෂණය විය.	-එම-	-එම-

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ නිෂ්පාදන අංශය විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගණනය කරන ලද සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6294 ක් සහ සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2343 ක්වූ අතර ගිණුම් අංශය ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 6227.14ක් හා මෙට්‍රික් ටොන් 2067.3 ක්	නිෂ්පාදන අංශය මගින් ලබා දෙන ලද දෛනික නිෂ්පාදිත Excel දත්ත සටහන් හා දෛනික Log Sheet දත්ත සටහන් අතර නොගැලපීම් පවතින අතර, විගණනයට ලබා දුන් දෛනික නිෂ්පාදිත Excel දත්ත සටහන් හා ඉහත දත්ත අතර වෙනස 127,800 Kg ක් බව, ඒ අනුව නිවැරදි නිෂ්පාදිත අගය 8,508,600Kg ක් ලෙස නිවැරදි විය යුතු බව, ඇසුරුම් අංශය මගින්	මේ සම්බන්ධයෙන් පූර්ණ විධිමත් විමර්ශනයක් සිදුකර විගණනයට වාර්තා කළ යුතුය.

	විය. ඒ අනුව ත්‍රිපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 66.86 ක් සහ සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 275.7 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කරන ලද අවසාන තොගය ත්‍රිපෝෂ මෙට්‍රික් ටොන් 66.86 ක් සහ සුපෝෂ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 275.7 කින් අඩුවෙන් නිරූපණය විය. කෙටුම්පත් වාර්තාවට සමාගමේ සභාපති විසින් විගණනයට ලබා දෙන ලද පිළිතුර අනුව නිෂ්පාදන අංශය මගින් ලබා දෙන ලද දෛනික නිෂ්පාදිත පැතුරුම්පත් දත්ත සටහන් හා ලොග් පත්‍ර දත්ත සටහන් අතර නොගැළපීම් පවතින බවත් ලොග් පත්‍රිකා අනුව මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8508.6 බව දක්වා තිබුණි. කෙසේ වුවත් විගණනය වෙත ඉදිරිපත් කරන ලද අමුද්‍රව්‍ය භාවිත අනුපාතයන් හා ප්‍රමාණයන් සැලකීමේදී කිරිපිටි භාවිතය අනුව මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8665.83 හා ඛනිජ ලවණ භාවිතය අනුව මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8533.33 ක් බවත් නිරීක්ෂණය විය.	ගබඩා අංශයට ලබා දෙන ලද නිමි තොගය ගිණුම් කටයුතු සඳහා භාවිතයට ගන්නා අතර ගිණුම් සටහන් හා නිෂ්පාදිත දත්ත අතර වෙනස 214,130 Kg ක් බව, සමානායයෙන් ඇසුරුම් යන්ත්‍ර සඳහා භාවිතා වනුයේ Auger Filling System (පරිමාණය අනුව පිරවීම) පද්ධතියක් සහිත යන්ත්‍ර වේ. ධාන්‍යමය නිෂ්පාදනයන්හි ඝණත්වය වෙනස් වන බැවින් පැකට්ටුවක බර ග්‍රෑම් 10ත් 15ත් අතර පරාසයක අගයක් එකතු කර එහි ශුද්ධ බර Net Weight නිවැරදිව පවත්වා ගැනීමට භාවිතා කරන බව, 2024 වර්ෂය තුල මුලු ත්‍රිපෝෂ හා සුපෝෂ පැකට් 13,194,635 ක් නිෂ්පාදනය කර ඇති අතර අවම වශයෙන් 131,946 Kg කට නොවැඩි ප්‍රමාණයක් මුලු නිෂ්පාදිතය තුල බෙදී ගොස් ඇති බව,	
(ආ)	කළුතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ත්‍රිපෝෂ අවශ්‍යතාවය සමාලෝචිත වර්ෂය පුරා ඒකාකාරී අගයකින් යුක්තව පැවතියද බේරුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ත්‍රිපෝෂ අවශ්‍යතාවය වෙනස් වී තිබුණි. 2024 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල අවශ්‍යතාවයට සාපේක්ෂව මාර්තු මාසයේදී සහ අප්‍රේල් මාසයේ දී දරුවන් සඳහා වන මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය පැකට් 570 කින් පහළ ගොස් පැවති අතර මව්වරුන් සඳහා වන මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය පැකට් 2700 කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. නැවතත් 2024 අප්‍රේල් මාසයට සාපේක්ෂ 2024 මැයි මාසයේදී මව්වරුන් සඳහා අවශ්‍ය මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය පැකට් 2010 කින් පහළ ගොස් දරුවන් සඳහා වන මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය පැකට් 2010 කින් ඉහළ ගොස් පැවතුණි.ඒ අනුව නිවැරදි දත්ත පදනම් කරගෙන තාත්වික	කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය මගින් පාලනය වන බේරුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවය වර්ෂය තුල අවස්ථා කිහිපයක් තුල සංශෝධනය කිරීම් සිදු කර ඇති බව, එමෙන්ම ඉහත සංශොධනයන් සිදු වූ 2024 මාර්තු හා අප්‍රේල් මාසයන්හි ත්‍රිපෝෂ තොග නිකුත් කිරීමක් සිදු වී නොමැති අතර ඊට අදාළව ත්‍රිපෝෂ නිකුත් කර ඇත්තේ 2024 මැයි මස බව, එම සංශෝධනය කිරීම් නිවැරදි දත්ත පදනම්ව තාත්වික ඇස්තමේන්තු මත සිදු කර තිබේද යන්න සෞඛ්‍ය අමාත්‍යාංශ පවුල් සෞඛ්‍ය කාර්යාංශය හා පෝෂණ සම්බන්ධීකරණ අංශයන් වෙතින් තහවුරු කර ගත යුතු බව.	සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා සෞඛ්‍ය බලධාරින් හා සමාගම එක්ව විධිමත් දත්ත ලබාගෙන ඒ අනුව ත්‍රිපෝෂ බෙදාහැරීම සිදුකළ යුතුය.

	ඇස්තමේන්තු පිළියෙල කර තිබේද යන්න පිළිබඳ විගණනයට ගැටළු සහගත විය.		
(ඇ)	2024 දෙසැම්බර් 19 දිනැති අංක 03/146/06 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත තැන්පතු පොළී ආදයම හා අපතය විකිණීමෙන් ලබන ආදායම පදනම් කර ගෙන සමාගමේ සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.14,674,836 ක දිරිදීමනාවක් ගෙවා තිබුණු අතර ත්‍රිපෝෂ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇතිවන බැහැරවීම් මෙලෙස අපතය ලෙස විකුණන අතර, එම ලැබෙන මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බැර කළ යුතු වුවත් මෙම දිරි දීමනාව ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. එසේම මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. පැමිණීම හා කාර්යසාධනය මත ලබාදෙන දීමනාවක් ලෙස මෙම දිරිදීමනාව නම් කළද පැමිණීම සම්බන්ධයෙන් පමණක් සලකා තිබුණු අතර, කාර්යසාධනය ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. තවද, සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සමාගමේ පවතින නීති, රීති අනුගමනය කර නොතිබුණු බැවින් පැමිණීම පදනම් කරගෙන සිදුකරන මෙම ගෙවීම්වල වලංගුතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටලු සහගත විය.	අදාළ දිරි දීමනාව සම්බන්ධ සියළු විස්තර පරිපාලන රීති සංග්‍රහයේ 06 වන පරිච්ඡේදයේ අතිකාළ හා අනෙකුත් දීමනා යටතේ විග්‍රහ කර ඇති බව, ඒ මත වාර්ෂිකව සකස් කරනු ලබන දිරි දීමනා චක්‍රලේඛය ප්‍රකාරව සේවක පැමිණීමේ බලපෑම මත ඵලදායිතාව ඉහළ යෑම, නිෂ්පාදන කාර්යය සාධනය හා මූල්‍ය කාර්යය සාධනය හේතුවෙන් 2024 වර්ෂයේදී ද මෙම දීමනාව ලබා දීමට සාධක කර ගන්නා ලද බව, මෙම දිරිදීමනාව සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු එකගතාවය PE/COM/SLTL/EST හා 2012/11/28 දිනැති ලිපිය ප්‍රකාරව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කර ඇති බව, තවද PED 03/2024 දරන චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම/ කාර්යය සාධනය මත දිරි දීමනා ගෙවන අවස්ථාවකදී ප්‍රසාද දීමනා ගෙවිය යුතු ආකාරය පිළිබඳවත් PED 08/2022 චක්‍රලේඛය ප්‍රකාරව ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ගෙවීම සම්බන්ධයෙන්ද සඳහන් කොට ඇති බව, අමුද්‍රව්‍ය මිළදී ගැනිම ඇතුළු සියළුම මෙහෙයුම් වියදම් ත්‍රිපෝෂ සමාගම විසින් දරන ලද බැවින් නිෂ්පාදන බැහැරවීම් (අපතය) අලෙවි ආදායම ත්‍රිපෝෂ සමාගමේ ආදායමක් වන අතර එම ආදායම මත පදනම්ව සමාගම විසින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත VAT සහ SSCL බදු ගෙවීම්ද සිදු කළ යුතු බව,	අදාළ විධිමත් අනුමැතිය ලැබෙන තුරු මෙහෙයුම් අත් පොතෙහි දැක්වෙන කරුණු ක්‍රියාත්මක නොකළ යුතු අතර මේ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතින් ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	ත්‍රිපෝෂ සමාගමේ විධායක නොවන නිලධාරීන් සඳහා පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පරීක්ෂක ගාස්තු සංශෝධනය කරගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අංක CF/EXSA/03/2023 හා 2024 මාර්තු 26 දිනැති ලිපියෙහි සඳහන්	අදාළ රේටයන් පිළිබඳ අදහසක් ගැනිම උදෙසා CF/EXSA/03/2023 හා 2024/03/26 දිනැති ලිපියෙහි සඳහන් රේටයන් උපයෝගිකර ගන්නා ලද බව, තවද රාජ්‍ය ව්‍යාපාර සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිපි අදාළ කර ගත නොහැකි බැවින් සංශෝධනය කිරීමට යෝජිත රේටයන් සඳහා සභාපතිවරයාගේ අනුමැතිය මත	විධිමත් අනුමැතියක් රහිතව සිදුකර ඇති වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර විගණනයට වාර්තා කළ යුතුය.

	රේටයන් මත පදනම්ව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවෙන් නිලධාරීන් සඳහා රු. 184,975 ක් ගෙවීම් කර තිබුණි. ගාස්තු ගෙවීම් කරන අවස්ථාව වනවිට අනුමැතිය නොලද රේටයන් මත ගෙවීම් කිරීම හේතුවෙන් රු.110,075 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ගෙවීම් කර ඇති බව.	
(ඉ)	සී.ටී.සී. සමාගම විසින් වැටුප් වර්ධක ලබා දීමේදී වැටුප් රහිත නිවාඩු ලබා නොගත් සහ කැපවීමෙන් යුතුව රාජකාරී කටයුතු කළ සේවකයන්ට සේවක දිරිගැන්වීමක් වශයෙන් එකවර වැටුප් වර්ධක දෙකක් ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් 2024 වර්ෂය සඳහාද නිලධාරීන්ට වැටුප් වර්ධක 02 ක් එකවරකදී ලබා දී තිබුණි. නමුත් සමාගමේ සම්පූර්ණ අයිතිය රජය සතුවීමෙන් පසු රජයේ නිලධාරීන්ට අදාළ නීතිරීති රෙගුලාසිවලට අනුකූලව වැටුප් වර්ධක ලබා දියයුතු වුවත් වැටුප් වර්ධක 02 ක් එකවර ලබා දීමේ ක්‍රමවේදයක් සඳහා විශේෂ අනුමැතීන් අදාළ ආයතන වලින් ලබා ගැනීමකින් තොරව අනුමත කළ/නොකළ වැටුප් රහිත නිවාඩු ලබා නොගත් සේවකයින් 166 කට සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි. ඒ අනුව මාසිකව රු.67,180 ක මුදලක් වැටුප් වර්ධක ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	2023 මූල්‍ය වර්ෂයේ සමාගම විසින් ලඟා කර ගත් මූල්‍ය (බදු පෙර ලාභය) හා නිෂ්පාදන කාර්යය සාධනය මත 2024 වර්ෂය සඳහා වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා ඇති බව.	-එම-
(ඊ)	ත්‍රිපෝෂ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර එය අදාළ අංශ නියෝජනය වන පරිදි පත්කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් නියෝජිතයා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 9 න් කිසිඳු රැස්වීමකට ඔහු සහභාගි වී නොමැති බව බව නිරීක්ෂණය විය.	සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම ආරාධනා කරනු ලබන බව.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සහභාගීත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ත්‍රිපෝෂ සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.69, 875,428 ක්වූ මළ නොබැඳෙන වානේ ගබඩා ටැංකි (Stainless-Steel Storage Tanks) ස්ථාපිත කර තිබුණු අතර එයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ඇ) ප්‍රකාරව තාක්ෂණික ඇහයීම් කමිටුව විසින් ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීම සහ ලංසු ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ බාහිර උපදේශකයන්ගෙන් සහය ලබාගත හැකි වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1 ප්‍රකාරව, ලංසු ඇහයීම උපදේශකයෙකුට භාර කරනු ලැබුව හොත්, එය සිදු කළ යුත්තේ තාක්ෂණික ඇහයීම් කමිටුවේ අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය යටතේ විය යුතු අතර උපදේශකයන් තාක්ෂණික ඇහයිම් කමිටුවේ සාමාජිකයන් නොවිය යුතුය. එසේම තාක්ෂණික ඇහයීම් කමිටුව විසින් තම කමිටුවේ විධිමත් වාර්තාවක් සමඟ උපදේශකයන්ගේ වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.එසේ වුවද, ඉහත සඳහන් මාර්ගෝපදේශයට අනුකූල නොවන ලෙස ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීම සහ ලංසු ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස පත්කරන ලද අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරුවරයෙකු කොන්ත්‍රාත්තුවේ බාහිර උපදේශක ලෙස පත්කර තිබුණු අතර එම උපදේශන කාර්යය වෙනුවෙන් ත්‍රිපෝෂ සමාගම විසින් රඳවා ගැනීමේ බදු ඇතුලුව රු.1,007,608 ක් උපදේශක ගාස්තු ලෙස ගෙවීම්කර තිබුණි. මෙම උපදේශක සේවා ගාස්තුව සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රේෂණය කළ යුතු වුවත්	සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අදාළ උපදේශකවරයාගේ සේවය ලබා ගෙන ඇති අතර එම අවසරය මත රාජකාරි වේලාවෙන් බැහැරව උපදේශන සේවා ලබා ගෙන ඇති බැවින් ඔහු වෙත සෘජුවම උපදේශන සේවා ගාස්තු ගෙවා ඇති බව, සමාගම විසින් 2024/2025 තක්සේරු වර්ෂයේ අදාළ පුද්ගලයා වෙත ගෙවූ සියළු ගෙවීම් හා අඩු කරන ලද රඳවා ගැනීමේ බදු (WHT) පිළිබඳ විස්තර දේශිය ආදායම් දෙපාර්තමේනතුවේ RAMIS පද්ධතියට ඇතුළත් කොට ඇති බව, සමාගම විසින් උපදේශන සේවාවන් ලබා ගන්නා ආයතන හෝ පුද්ගලයන්ට කළ ගෙවීම් ඉහත සඳහන් කළ ආකාරයට දේශිය ආදායම් දෙපාර්තමේනතුව වෙත වාර්තා කිරීමත් අදාළ සේවා සපයන ආයතන හෝ පුද්ගලයන්ට ත්‍රිපෝෂ සමාගම මගින් රඳවා ගැනිමේ බදු සහතික පත්‍ර නිකුත් කිරිමක් කළ යුතු බව, ඉදිරි වැඩ ප්‍රසම්පාදනයන් (Works Contract) සඳහා ලංසු ඇගයිම් කමිටු නිළධාරින් උපදේශන සේවා කටයුතු සඳහා සහභාගි නොකිරිමට අවශ්‍ය කටුයතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ඒ අනුව කටයුතු නොකර අදාළ ඉංජිනේරුවරයා වෙත සෘජුව ගෙවා තිබුණි. එසේම එම කාර්යය සඳහාම තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කිරීම වෙනුවෙන් රු.10,000 ක්ද එම පුද්ගලයාටම ගෙවීම් කර තිබුණි.		
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 ප්‍රකාරව ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට ඒඅනුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි වුවද මෙම ප්‍රසම්පාදනය සඳහා ආයතන 04 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණද ඉන් ආයතන 03 ක් මූලික සුදුසුකම් පරීක්ෂාවේදී ප්‍රතික්ෂේප වී තිබුණු අතර ඇස්තමේන්තුවෙහි සඳහන් අගයන් හා ප්‍රතික්ෂේප නොවූ එකම ලංසුවේ මිල අතර ප්‍රමාණාත්මක විචලතාවයන් පැවති බැවින් සියලුම ලංසුකරුවන්ට අසාධාරණයක් නොවන අයුරින් ඉහත මාර්ගෝපදේශ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් තරඟකාරී මිලක් ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරුවෙකු වෙත මෙම කොන්ත්‍රාත්තුව පැවරීමේ අවස්ථාව සමාගමට අහිමි වී තිබුණි.	අදාළ වැඩ ප්‍රසම්පාදනයේ ඇස්තමේන්තු ගත වටිනාකම රු. මිලියන 60ක් බව, ඒ සඳහා ලංසුකරුවන් 04දෙනෙකු ඉදිරිපත් වී තිබුණු බව, මූලික සුදුසුකම් පරීක්ෂාවේදී ලංසුකරුවන් 03 දෙනෙකු ප්‍රතික්ෂේප වී තිබුණු බව, ඒ අනුව විස්තරාත්මක ඇගයීමෙන් සුදුසුකම් ලැබූ ආයතනය වෙත මිල සමාලෝචනයක් මගින් අදාළ කොන්ත්‍රාත්තුව පිරිනමන ලෙස ලංසු ඇගයීම් කමිටුව නිර්දේශ කර ඇති බව, අදාළ කොන්ත්‍රාත්තුව නැවත කැඳවීමෙන් සමාගමට ඇති විය හැකි මූල්‍යමය පාඩුව සහ මිළ සමාලෝචනය මගින් ඒකඟ වූ මිල රු. මිලියන 69.87ක් (මුල් ලංසුවේ වටිනාකම රු.මිලියන 79.63කි.) විමත් ඉංජිනේරු ඇස්තමේන්තුව වන රු. මිලියන 60 ඉක්මවා තිබූ බැවින් සියළු කරුණු සලකා බලා සමාගමට මූල්‍යමය පාඩුවක් නොවන පරිදි සහ අදාළ ව්‍යාපෘතියේ ඇති වැදගත්කම සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් එකගතාවය මත ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කොට අදාළ කොන්ත්‍රාත්තුව පිරිනමන ලද බව.	-එම-
(ඇ)	ත්‍රිපෝෂ සමාගමේ ඉංජිනේරු හා සේවා කළමනාකරු විසින් 2021 නොවැම්බර් මාසයේදී පිළියෙල කර තිබුණු රු.59,058,450 ක්වූ මුලු පිරිවැය ඇස්තමේන්තුව පදනම් කරගනිමින් ලංසුකරුවන්ගේ මිල ගණන් ඇගයීම සිදු කර තිබුණි. එම මිල ගණන් හා මුලු පිරිවැය ඇස්තමේන්තුව සැසඳීමේදී මිල විචලතාවය සියයට 27 සිට සියයට 38.56 දක්වා පැවතුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව සඳහා අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ හා	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම දීර්ඝ කාලයක් සිට අපේක්ෂා කළද සමාගමේ ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිපාදන නොලැබීමත් හේතුවෙන් මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බව, ඒබැවින් සමාගමේ අභ්‍යන්තර අරමුදල් මගින් ඇසුරුම් අංශයේ පෙර ස්ථාපිත කර තිබූ Fiber ටැංකි 03 ගලවා ඉවත් කොට ඒ වෙනුවට සුදු යකඩ ටැංකි 03ක් ස්ථාපිත කිරීමට ජාතික ප්‍රසම්පාදන	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

තෝරාගත් ලංසුකරුගේ මිල අතර රු.36,644,995 ක එනම් සියයට 46 ක සැළකිය යුතු වෙනසක් ඇගයීම සිදු කරන අවස්ථාවේදී පැවතුණි. 2023 දෙසැම්බර් 08 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව 2021 නොවැම්බර් මාසයේදී මුලු පිරිවැය ඇස්තමේන්තුව සකසා ඇති බවත් පසුව සිදුවූ ඩොලර් අගයේ වැඩිවීමත් සමඟ ආනයනික ද්‍රව්‍ය සහ අනෙකුත් සේවාවන්වල මිල වැඩිවීම ලංසුකරුවන්ගේ මිලගණන් ඉහල යාමට හේතු වි ඇතිබව සඳහන් කර තිබුණි. එසේවුවද 2023 වර්ෂයේදී ප්‍රසම්පාදනය ආරම්භ කරන ලද මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2021 වර්ෂයේ ඉංජිනේරු ඇස්තමේන්තුව පදනම් කර ගනිමින් 2024 වර්ෂයේ ලංසු ඇගයීම සිදු කිරීම නුසුදුසු බවත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 ප්‍රකාරව ආරම්භක මුලු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමෙන් පසු ලංසු කැඳවීම සඳහා සැහෙන කාලයක් ගතවූවහොත් උද්ධමනය සහ වෙනත් කරුණු සැලකිල්ලට ගෙන මුලු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කළ යුතුය. එසේවුවද මාර්ගෝපදේශය අනුව කටයුතු සිදු කිරීම වෙනුවට කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ලංසුකරුවෙකු තෝරා ගැනීමෙන් පසු නැවත සංශොධිත මුලු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර තෝරාගත් ලංසුකරුගේ මිල ගණන්ද සංශෝධනය කර සැසඳීම් කර තිබුණි. ඒ අනුව සිදුකරන ලද සැසඳීමේදී සංශෝධිත මිල ගණන් අනුවද එක් එක් අයිතමයන් සඳහා විචලතාවය සියයට 30 සිට සියයට 932 දක්වා පැවතුණි. ඉහත කරුණු සැළකීමේදී උපදේශක සහ තාක්ෂණික ඇගයීම් කමිටුව තම වගකීම් නිසි පරිදි ඉටුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

මාර්ගොපදේශ සංග්‍රහය අනුව ක්‍රියාමාර්ග ගන්නා ලද බව, 2021 වර්ෂයේ ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙළ කරන අවස්ථාවේ මිළ ගණන් හා 2024 ලංසු ආරාධනා කරන අවස්ථාවේ මිල ගණන් අතර විශාල මිල පරාසයක් නොතිබුනද සුදුසුකම්ලත් ලංසුකරු සමග මිල කතිකාවතකට යාමේදි පැවති මිල ගණන් මත ලංසු ඇගයීම් කමිටුව විසින් අදාළ නිර්දේශ ලබා දී ඇති බව.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ බඳවා ගැනීම් පටිපාටිය අනුව මුදල් නිලධාරි තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර තිබුණද එවැනි තනතුරක් වර්තමානයේදී නිරීක්ෂණය නොවන බැවින් එම තනතුර අවශ්‍ය නොවන්නේ නම් අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 ජනවාරි මාසයේ සිට මුදල් නිළධාරි තනතුර පුරවා ඇති අතර එය Payroll හි විධායක නිළධාරි ලෙස සඳහන්ව ඇති අතර තනතුරු නාමය වෙනස් කිරිමට කටයුතු කරන බව දන්වමි.	අවශ්‍ය සංශෝධනයන් සඳහා විධිමත් අනුමැතීන් ලබාගත යුතුය.
(ආ)	සමාගම විසින් 2016 වර්ෂයේදී පරිපාලන රීති සංග්‍රහය සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි. කෙසේ වුවත් සමාගම විසින් එහි අඩංගු ඇතැම් අනුමත නොවූ නිතී,රීතී අනුගමනය කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.	පරිපාලන රිති සංග්‍රහය ඇතුළුව සමාගමේ සියළුම අංශ ආවරණය වන මෙහෙයුම් අත්පොත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව යොමු කර ඇති බව, ඊට අදාළ ඇගයිම් කටයුතු සිදු කරමින් පවතින බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පවසන ලද බව.	මෙහෙයුම් අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තුරු ක්‍රියාත්මක නොකළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/1 – 2019 දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හා 134 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තාවල පිටපත් කාලානුරුපිව පවත්වනු ලබන විගණන හා කළමණාකරන රැස්වීම් වෙත ඉදිරිපත් කිරිමට උපදෙස් ලබා දෙන ලද බව.	වාර්ෂික අභ්‍යන්තර විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර නිකුත් කරනු ලබන අභ්‍යන්තර විගණන විමසුම්වල හෝ වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ව්‍යාපාර හැසිරීම පිළිබඳ 2021 නොවැම්බර් 16 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (h) ඡේදය ප්‍රකාරව විගණන කළමනාකරණ කමිටු රැස්වීම මාස තුනකට එකක් පැවැත්විය යුතු වුවද ත්‍රිපෝෂ සමාගමේ 2024 වර්ෂයට අදාළව පවත්වා තිබුණේ රැස්වීම 2 ක් පමණි.	2024 වර්ෂයේ තුන්වන කාර්තුවේ පැවැත්වීමට සැලසුම් කර තිබුණු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීමට ලද උපදෙස් ප්‍රකාරව නොපැවැත්වුණු බව, මෙම වර්ෂයේ සිට අවම වශයෙන් රැස්වීම් වාර 04ක් පැවැත්වීමට කටයුතු කරන බව.	නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත් වීමට කටයුතු කළ යුතුය.